ඒකකය - සරල රේඛාව

නිපුණතාවය 18:- කාටීසීය ඛණ්ඩාංක ඇසුරෙන් සරල රේඛාව විවරණය කරයි.

1. (0,5) ලක්ෂයේදී y අක්ෂය ඡේදනය කරන්නා වූද අනුක්‍රමණය 1/3 වූද සරල රේඛාවේ සමීකරණය සොයන්න .
2. (-2,1), (5,3) යන ලක්ෂ්‍ය හරහා යන සරල රේඛාවේ සමීකරණය ලබාගන්න .
3. OX සමග 135° ක කෝණයක් සාදමින් (-2,3) ලක්ෂ්‍ය හරහා යන සරල රේඛාවේ සමීකරණය සහ අක්ෂ මත එහි අන්තක්ඛණ්ඩය ද සොයන්න .
4. සරල රේඛාවකට මූල ලක්ෂයේ සිට ඇති ලම්බ දුර ඒකක 3 ද ලම්භය x අක්ෂයේ ධණ දිශාව සමග සාදන කෝණය 30° නම් එම සරල රේඛාවේ සමීකරණය සොයන්න .
5. 2x-y-5 =0 සහ 3x +y -10=0 සමීකරණ වලින් දැක්වෙන සරල රේඛා දෙකේ ඡේදන ලක්ෂය සොයන්න .
6. 2x+ 3y-5=0 සරල රේඛාවට සමාන්තරව A(-1,2) ලක්ෂය හරහා යන රේඛාවේ සමීකරණය සොයන්න .
7. 2x+ 7y-12=0 රේඛාවට ලම්බව (1,0) ලක්ෂය හරහා යන සරල රේඛාවේ සමීකරණය සොයන්න .
8. පහත දී ඇති ලක්ෂයේ සිට දී ඇති රේඛාවට ලම්බ දුර සොයන්න
   - (-3,0) සිට 3x + 4y-5 = 0
   - (-3,-5) සිට x +y+5 = 0
   - x+y+4=0 හා x+y-3=0 රේඛා අතර දුර සොයන්න.